# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය
த. பெ.இ
Po.Box No — 2171635 — 10120

ෆැක්ස්
தொலைநகல
Fax — 011-

දුරකථන
தொலைபேசி
Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site — www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail — dir.media@police.gov.lk


මගේ අංකය
எனது இலக்கம்
My NO — 1588 / 2024

ඔබේ අංකය
உமது இலக்கம்
Your No — / 2024

දිනය
திக
Date — 16/10/2024 පැය 0610

**මාධ්‍ය නිවේදනය**

**සැකසහිත ලෙස හෝටලයක රැඳී සිටි විදෙස් ජාතිකයින් පිරිසක් අත්අඩංගුවට - පුත්තලම කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය.**

2024.10.15 වන දින රාත්‍රී කාලයේ හලාවත පොලිස් වසමේ ඉරණවිල මාර්ගයේදී පුත්තලම කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත හෝටලයක සැකසහිත ලෙස ලැගුම් ගෙන සිටි මැලේසියානු ජාතික පිරිමි පුද්ගලයින් 04 ක්, ඉතියෝපියානු ජාතික පිරිමි පුද්ගලයින් 03 ක් හා කාන්තාවක්, කෙන්යානු ජාතික කාන්තාවක් හා චීන ජාතික පිරිමි පුද්ගලයෙක් අත්අඩංගුවට ගෙන ඇත.

මොවුන් අන්තර් ජාලය ඔස්සේ මුදල් වංචා සිදු කරන බවට සැකපිට අත්අඩංගුවට ගෙන ඇති අතර, ඔවුන් සන්තකයේ තිබී **පරිගණක යන්ත්‍ර 20 ක්, රවුටර් 03 ක් සහ ජංගම දුරකථන 282 ක්** පොලිස් භාරයට ගෙන ඇත.

පුත්තලම කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**